## කොරියානු භාෂා පරීක්ෂණය සඳහා විභාග අයදුම්පත් නිකුත් කිරීම -2022(ධීවර ක්ෂේත්‍රය)

## අයදුම්කරුවන් සඳහා අවශ්‍ය උපදෙස්



**2022 වර්ෂයට අදාළව පැවැත්වෙන නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා විභාග අයදුම්පත් ලබාගත් අයදුම්කරුවන් හට මෙම පරීක්ෂණය සඳහා විභාග අයදුම්පත් ඉල්ලුම් කිරීමට අවස්ථාවක් නොලැබෙන බවද කාරුණිකව සලකන්න.**

### විභාග අයදුම්පතක් ලබාගැනීමට සම්පූර්ණ කර තිබිය යුතු සුදුසුකම්:-

- වයස- අවුරුදු 18 ත් 39 ත්අතර(1982 අගෝස්තු 23සිට 2004 අගෝස්තු 22 දක්වා උපන් අය )
- සිරදඬුවම් හෝ බරපතල දඬුවම් නොලැබුණු අය විය යුතුය.
- කොරියානු ජනරජයෙන් ආපසු හරවා හෝ නෙරපා එවු අය නොවිය යුතුය.
- මෙරටින් විදේශ රටකට බැහැරවීම් තහනම් නොකළ අයෙක් විය යුතුය.
- වර්ණ අන්ධ හෝ වර්ණ දුර්වලකම් නොමැති අයෙකු විය යුතුය.
- **ඊ-9 වීසා කාණ්ඩය සහ ඊ -10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වු සේවා කාලයද ඇතුළුව වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තන් විය යුතුය.**
- කොඳු ඇට පෙළේ ආබාධයක් හෝ ඇඟිලි ආබාධ ඇති අයට ඉපීඑස් විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොමැත.

**ඊ-9 වීසා කාණ්ඩය සහ ඊ-10** වීසා කාණ්ඩය යටතේ වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර ඇත්නම් කොරියානු රටෙහි නීතිය වෙනස් වු නිසා EPSවීසා බලපත්‍රයක් නිකුත් කළ නොහැක.

### විභාග අයදුම්පතක් ලබාගැනීමට අවශ්‍ය දෑ:-

- මෙවර විභාග අයදුම්පත් නිකුත් කිරිම අන්තර්ජාලය ඔස්සේ -මාර්ගගතව(online) සිදු කරන බැවින් ලියාපදිංචි වීමට පෙර පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඔබ සතුව තබා ගැනීමට කටයුතු සිදු කරන්න. **ලියාපදිංචිය සිදු කරනු ලබන දිනයන්-2022.08.22 සිට 2022.08.26 දක්වා**

- **වසර 01 ක කාලයක් සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ඔබගේ ඡායාරූපය සහිත පිටුවෙහි ස්කෑන් කරන ලද JPG ඡායාරූපයක් (1MB) විය යුතුය.**

- මාස 03ක් ඇතුළත ලබාගත් 3.5 cm * 4.5 cm ප්‍රමාණයේ **සුදු පැහැති** පසුබිම සහිත පැහැදිලි ස්කෑන් කරන ලද වර්ණ ඡායාරූපයක් JPG විය යුතුය. ( සුදු පැහැති ඇඳුමකින් සැරසී ජායාරූපය ගැනීමෙන් වැළකී සිටිය යුතුය)

  - Photo width : 100-300 pixels
  - File type: Only JPG
  - File Size: 1MB
  - ඔබගේ මුහුණ පැහැදිලිව පෙනීම අනිවාර්යය වන අතර,ඡායාරූපය සඳහා බෝඩර්,අකුරු ආදිය ඇතුළත් නොකළ යුතුය.
  - ශරීරය සෘජුව තබා ඡායාරූපය ලබා ගත යුතුය.
  - ඇස් කණ්ණාඩි නොපැළඳ ඡායාරූපය ලබාගත යුතුය.

- **වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවය ඇති අයදුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ.**

- **ඔබ විභාගය සමත්වීමෙන් පසුව කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි වීමට පෙර සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයේදී වර්ණ අන්ධතාවය පරීක්ෂාවට ලක් කරනු ලබන අතර එම අවස්ථාවේදී ඔබට වර්ණ අන්ධතාවය ඇති බවට තහවුරු වුවහොත් ඔබගේ විභාග ප්‍රතිඵල අවලංගු වනු ලැබේ.**

- **විභාග අයදුම්පත් ගාස්තුව- ඇමරිකානු ඩොලර් 28 ට සමාන රුපියල් අගය (රු.10,108/-)**

- මෙම අයදුම්පත් ගාස්තුව ගෙවීම් කිරිමේදී ඔබට ආසන්නතම ජාතික ඉතිරිකිරිමේ බැංකුව,ලංකා බැංකුව හා මහජන බැංකුවෙහි පහත සඳහන් ගිණුම් අංකය වෙත බැර කිරිම සිදු කළ යුතුය.

  - 100-800-44-2461 - ජාතික ඉතිරි කිරීමේ බැංකුව (බත්තරමුල්ල ශාඛාව)
  - 0000001650 - ලංකා බැංකුව ( ආයතනික ශාඛාව)
  - 20810015179-1068 - මහජන බැංකුව (බත්තරමුල්ල ශාඛාව)

- ලියාපදිංචිය සිදු කරනු ලබන අවස්ථාවේදීම ඔබට මුදල් ගෙවීම සඳහා බැංකුව වෙත යාමට අපහසු බැවින් **2022.08.15 සිට2022.08.19** දක්වා කාල සීමාව තුළ පමණක් මුදල් ගෙවා අදාළ රිසිට්පතද ස්කෑන් කර (File Size: 1MB) තබා ගැනීමට කටයුතු කළ යුතුය.**Online/ATM භාවිතයෙන් ගෙවීම් සිදු කිරීම් සිදු කළ නොහැක.**

- **බැංකු රිසිට්පත සම්පූර්ණ කිරිමේදී අනිවාර්යෙන්ම ඔබගේ නම,ලිපිනය, නව විදේශ ගමන් බලපත්‍ර අංකය, ජාතික හැඳුනුම්පත් අංකය,දුරකථන අංකය සහ ඔබගේ ගමන් බලපත්‍ර යේ සඳහන් අත්සන පැහැදිලිව සටහන් කළ යුතුය.එසේ නොවන රිසිට්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

- **ඉහත දින 05න් පසුව ගෙවීම් කරනු ලබන රිසිට්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වර්ණ කර ඇති සියලුම විස්තරයන් සම්පූර්ණ කළ යුතුය.**


NSB NATIONAL SAVINGS BANK

CASH DEPOSITS

Name: S.L.B.F.E

Bill / Account No. 100-800-44-2461

Amount (Rs.) 10,108/=

Amount in Words: දහදහස් එකසිය අට යි ශත 0

For Cash deposits of Rs. 200,000/- or above made by a person other than the account holder

Depositor's Name: ඔබගේ විදේශගත බලපත්‍රයේ පරිදි නම ලියන්න.

Depositor's Address: ඔබගේ ලිපිනය ලියන්න.

NIC No.: ජා:හැ: අං: ලියන්න. Tel No.: දු: අං: ලියන්න.

Purpose of Deposit: ඔබගේ ගමන් බලපත්‍ර අංකය ලියන්න.

Total: 10,108 - 00

For official use only

Teller

PEOPLE'S BANK

CASH DEPOSIT SLIP SAVINGS

Form No. 213/1 DP

Date: 2022

Account Number: 208100151791068

Name of Account Holder: S.L.B.F.E.

Amount in words: රුපියල් දහදහස් එකසිය අටයි

Depositor Name: ඔබගේ නම ලියන්න.

Address: ලිපිනය ලියන්න. Tel: දුරකථන: ලියන්න

NIC/PP/DL No.: විදේශ ගමන් බලපත්‍ර අං: ලියන්න

Purpose: ගමන් බලපත්‍ර අංකය ලියන්න

Cash Depositor's Signature: ඔබගේ අත්සන යොදන්න. Cashier's Signature

Total: 10108 00

ඉතුරුම්
சேமிப்பு
SAVINGS

BANK OF CEYLON — Bankers to the Nation

මුදල් තැන්පතු පත්‍රිකාව பண வைப்புச் சீட்டு Cash Deposit Slip — Date

Account/Card Number: 0000001650

S.L.B.F.E

Account/Card Holder's Name and Address:

For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder

Depositor's Name and Address: ගමන් බලපත්‍රයේ සඳහන් පරිදි ඔබගේ නම ලියන්න.

N.I.C./P.P./D.L No: ගමන් බලපත්‍ර අංකය ලියන්න.

Telephone No: දු: අං: ලියන්න.

Purpose of Deposit: ගමන් බලපත්‍ර අංකය ලියන්න.

Depositor's Signature: ඔබගේ අත්සන ලියන්න.

Total: 10 108 00

Validation checked

Signature

## <u>විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය උපදෙස්:-</u>

- **පියවර:- 1**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියට (www.slbfe.lk) පිවිස **Registration for Point System Examination -2022 (Fishery Sector)** වෙත පිවිස ඔබගේ තොරතුරු ඇතුළත් කළ යුතුය.

ඔබ විසින් භාවිතා කරනු ලබන දුරකථන අංකය ඇතුළත් කරන්න. (අප විසින් ඔබගේ දුරකථන අංකයට කේත අංකයක් එවනු ලබන බැවින් ඔබගේ භාවිතා කරනු ලබන දුරකථන අංකයක් ඇතුළත් කිරීම පිළිබඳ සැලකිලිමත් වන්න)

ඉන් පසුව ඔබට පහත සඳහන් පරිදි තිරයක් දිස්වේ. එම තිරයේ දිස්වන සුදුසුකම් ඔබ විසින් සපුරා ඇත්නම් පමණක් ඉදිරියට **(Next)** බොත්තම වෙත යොමු වී **(Click )** කර ඉදිරියට යන්න.



Application | අයදුම්පත | 애플리케이션

1. අයදුම්කරු වයස අවුරුදු 18 ත් 39 ත් අතර අයෙකු විය යුතුය .(1982 මාර්තු 08 සිට 2004 මාර්තු 07 දක්වා උපන් අයෙකු විය යුතුය).
2. අයදුම්කරු සිරගතවීමක් හෝ බරපතල දඬුවමකට ලක්වී නොසිටි අයෙකු විය යුතුය
3. අයදුම්කරු සඳහා කොරියානු රජයෙන් පිටුවහල් කිරීමේ හෝ පිටත්වීමේ නියෝග වාර්තාවක් නොතිබිය යුතුය. කොරියාවේ නීති විරෝධී ලෙස එක් දිනක් හෝ රැඳී නොසිටි අයෙකු විය යුතුය.
4. අයදුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත්වීමේ තහනමකට ලක්නොකර අයෙකු විය යුතුය.
5. අයදුම්කරු E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වූ සේවා කාලයද ඇතුළුව වසර 05 කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තෙක් විය යුතුය.
6. අයදුම්කරු වර්ණ අන්ධතාවය හෝ, වර්ණ දුර්වලතාවයක් පවතින අයෙකු නොවිය යුතුය . කුසලතා පරීක්ෂණයේදී අයදුම්කරුගේ වර්ණ අන්ධතාවය පරීක්ෂා කරනු ලබන අතර එහිදී අයදුම්කරුට වර්ණ අන්ධතාවය පවතින බවට තහවුරු වුවහොත් පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ.
7. අයදුම්කරුගේ කොඳු ඇට පෙළෙහි අබාධ හෝ ඇඟිලි අඩු, කැඩුණු අබාධ නොතිබෙන අයෙකු විය යුතුය .
8. [redacted]

**සඳහන් අවශ්‍යතා සපුරා ඇත්නම් පමණක් අයදුම් කරන්න.**

විශේෂයි : අයදුම් කිරීමට පෙර උපදෙස් පත්‍රිකාව කියවන්න උපදෙස් පත්‍රිකාව

ඉදිරියට යන්න | NEXT

.

- **පියවර 2-** ඉදිරියට ගිය පසුව ඔබට පහත පරිදි දිස්වන තොරතුරු ඉංග්‍රීසි කැපිටල් අකුරු භාවිතා කර ඇතුළත් කරන්න.



Application | අයදුම්පත | 애플리케이션

Full Name |

NIC Number |

Passport Number |

Birth Day |

YEAR | MONTH | DAY

Gender |

SELECT GENDER

Applicant Mobile Number |

Address |

District |

SELECT DISTRICT

Email Address |

Related Person's Mobile Number |

Back

Next

ඔබගේ නම ඇතුලත් කිරිමේදී  ඉංග්‍රිසි කැපිටල් අකුරු භාවිතා කර විදේශ ගමන් බලපත්‍ර යේ **Barcode** හි සඳහන් ආකාරයට ඇතුළත් කළ යුතුය.

සැලකිය යුතුය- ඔබගේ නම ඇතුළත් කිරිමේදී එක් එක් නමක් අවසානයේ හිස්තැනක් තබමින් නම ඇතුළත් කළ යුතුය.




- **පියවර 3**-ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
- **පියවර 4**- ගමන් බලපත්‍ර අංකය ඇතුළත් කරන්න.
- **පියවර 5**-ඔබගේ උපන් දිනය **(දිනය/මාසය/අවුරුද්ද)** වශයෙන් තෝරන්න.
- **පියවර 6**-ස්ත්‍රී/පුරුෂ භාවය තෝරන්න.
- **පියවර 7**-ඔබගේ ජංගම දුරකථන අංකය නිවැරදිව ඇතුළත් කරන්න.( **මෙය නැවත වෙනස් කළ නොහැක)**
- **පියවර 8**-ඔබගේ ස්ථිර පදිංචි ලිපිනය ඉංග්‍රිසි කැපිටල් අකුරු භාවිතා කර ඇතුළත් කර පදිංචි දිස්ත්‍රික්කය තෝරන්න.
- **පියවර 9**-ඊමේල් ලිපිනය ඇතුළත් කරන්න.
- **පියවර 10**-ඔබගේ ළඟම ඥාතියෙකුගේ දුරකථන අංකයක් නිවැරදිව ඇතුළත් කරන්න.

**පසුව ( Next ) button (click ) කර ඉදිරියට යන්න. එවිට ඔබට පහත තොරතුරු ඇතුළත් කළ හැකිය.**



- **පියවර 11-**ඔබගේ ගමන් බලපත්‍රය නිකුත් කිරීමේ දිනය සහ කල් ඉකුත් වීමේ දිනය **(දිනය/මාසය/අවුරුද්ද)** වශයෙන් ඇතුළත් කරන්න.
- **පියවර 12 .-** ඔබ ධීවර ක්ෂේත්‍රයට අදාල පහත සඳහන් අනු ක්ෂේත්‍ර 02 න් එකක් අනිවාර්යෙන්ම තේරීම් කළ යුතුය.

1. මුහුදු වගාව(Sea Farming)  2. ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ( In and offshore Fishing )

- **පියවර 13.-**

ඔබගේ ඡායාරූපය සහ විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය ඇතුළත් පිටුවෙහි පැහැදිලි ස්කෑන් පිටපත් උඩුගත (Upload) කරන්න .

**සැලකිය යුතුයි- ඔබගේ ගමන් බලපත්‍ර පිටපත ස්කෑන් කිරීමේදී Barcode එක කැපී නොයන පරිදි සම්පූර්ණ පිටුවෙහි පිටපතක් ස්කෑන් විය යුතුය. එසේ නොවන අවස්ථාවන්හිදී ඔබගේ විභාග අයදුම් කිරීම අනුමත නොවනු ඇත.**




නිවැරදි

**ගමන් බලපත්‍ර ස්කෑන් පිටපත හා ඡායාරූප පිටපත උඩුගත (**(Upload) කළ පසුව **( Next ) button (click )** කර **ඉදිරියට යන්න. එවිට ඔබට පහත තොරතුරු ඇතුළත් කළ හැකිය.**



**පියවර 14:-**

ඔබ විසින් මුදල් ගෙවූ දිනය හා බැංකුවේ නම ඇතුළත් කර බැංකු රිසිට්පතෙහි පාරිභෝගික රිසිට්පත (Customer Copy) උඩුගත (Upload) කරන්න.

**පියවර 15:-**

ඔබ විසින් සම්පූර්ණ කරන ද සියළු තොරතුරු සහ කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් දන්වා ඇති නීති රීති වලට එකඟ බවටද, ඔබගේ ජංගම දුරකථනය වෙත ලැබෙන සත්‍යාපන කේතය (Verification code) භාවිතා කරමින් සනාථ කර ඔබගේ අයදුම්පත අප වෙත Apply බොත්තම ක්ලික් කර යොමු කරන්න.

**ඔබට සත්‍යාපන කේතය (Verification code) ලැබී නොමැති නම් නැවත ලබාගැනීම සඳහා (Click here ) බොත්තම ඇතුලත් කරන්න. නැවත අවශ්‍ය නොවේ නම් Apply බොත්තම ක්ලික් කර ඔබගේ අයදුම්පත අප වෙත යොමු කරන්න.**

අයදුම්පත පරීක්ෂා කිරිමෙන් පසුව ඔබගේ අයදුම්පත්‍රය අප වෙත ලැබුණු බවට ඔබට කෙටි පණිවුඩයක් මඟින් දැනුම් දෙනු ලබන අතර එහි සඳහන් යොමු අංකය (විභාග අයදුම්පත් අංකය )ලෙස භාවිතා කර ඔබගේ විභාග අයදුම්පත්‍රයේ වර්ණ පිටපතක් (Colour Printout) ලබාගන්න.


Exam Admission | Point System Based Examination | South Korea | 2022 — 90901465

| | | |
|---|---|---|
| Admission No | -: | 90901465 |
| Name | -: | KUMARA DISANAYAKE |
| National identity card Number | -: | 843100872V |
| Passport Number | -: | N1234567 |
| Mobile Number | -: | 0719632999 |
| Job Sector | -: | ASSEMBELING \| □□□□□□□ |
| Applicant Signature | -: | ........................ |

HRDK

2022 © All Rights Reserved, Information Technology Department,
Sri Lanka Bureau of Foriegn Employment.

ඔබ විසින් ඇතුළත් කළ තොරතුරු වල යම් දෝෂයක් පවතී නම් එම අයදුම්පත් අනුමත නොවනු ඇත. එසේ අනුමත නොකිරීමට හේතුව සඳහන් කර එය නිවැරදි කරන ලෙස අප විසින් ඔබ වෙත කෙටි පණිවුඩයක් එවනු ඇත. එම කෙටි පණිවුඩයේ සඳහන් පරිදි නිවැරදි කර අයදුම්පත නැවත යොමු කළ යුතුය.

**සියළුම අයදුම්කරුවන් ඉහත උපදෙස් අනුගමනය කරමින් විභාගය සඳහා ලියාපදිංචි වීමට කාරුණික වන්න.**